**මහනුවර මහා නගර සභාව - 2021**

**-------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මහනුවර මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුමවැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයපොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6(1)(ඈ)(iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව,මහා නගර සසභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල රු.8,610,518 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී මෙම තත්ත්වය නිවැරදි කරමි | බිල් කළ වරිපනම් ආදායම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ජල ගාස්තු බිල් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල රු.3,776,993 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම් වියදම් ගිණුම උපචිත පදනම මත හා වැටි වාර්තා මුදල් පදනමට සකස් කරන නිසා, වෙනසක් පවතින අතර, මේ පිළිබඳ පරීක්ෂා කර ඉදිරියේ දි වාර්තාවක් ලබා දෙන බව දන්වා ඇත | නිවැරදිව ජල ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ද දැක්විය යුතුය |
| (ඇ) | මහා නගර සභාව සතු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ගොඩනැගිලි 211 ක වටිනාකම තක්සේරු කර හෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා හෝ නොතිබුණි. | මෙම වර්ෂයේ තක්සේරු කිරීම් අවසන් කර ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව | ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.1,984,450 ක වාහන 02 ක් හා පරිගණක උපකරණ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සැපයුම් අංශයෙන් තොරතුරු ලබා ගෙන 2022 වර්ෂයේ නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට කටයුතු කරමි | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුය |
| (ඉ) | 2017 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා අවස්ථා 18 කදී වෙනත් ආයතනවලට පෙර ගෙවුම් ලෙස ගෙවා තිබුණු රු.4,776,282 ක් සඳහා වූ ගනුදෙනු නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේ දී මෙම සියලුම අත්තිකාරම් පියවීමට කටයුතු කරමි | පෙර ගෙවීම් සඳහා අදාළ ගනුදෙනු නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 14 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.698,885,040 ක වෙනසක් පැවතුණි. | මේ පිළිබඳ පැහැදිලි කිරිමක් ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සඳහා උපලේඛන හා වාර්තා නිවැරදිව පිළියෙල කළ යුතුය |

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.299,577,997 ක වත්කම් විෂයයන් 03 ක් සහ රු.476,505,857 කබැරකම් විෂයයන් 02ක්සඳහා වු උපලේඛන , භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා කේවළ ණයහිමි ශේෂ ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අදාළ ලේඛන සකස් කිරීම ප්‍රමාද වී ඇති බව පිළිගන්නා අතර, ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් හා බැරකම් විෂයයන් සඳහා වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති හා අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | ස්ථාන මාරු වී ගොස් මාස 03 ක කාලයක් ඉක්ම වූ නිලධාරීන් 179 දෙනෙකුගෙන් අය විය යුතු රු.10,021,227ණය ශේෂ අය කර නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රධාන ලේකම් හරහා නිරවුල් කර ගැනීමට කටයුතු කරමි | ස්ථාන මාරු වූ සේවකයින්ගේ ණය ශේෂ අය කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.565,729,320 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.609,888,349 ක්විය.

2.2 මූල්‍ය පාලනය

---------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට හා වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් සඳහා ගෙවිය යුතු රු.3,226,725 ක දායක මුදල් ගෙවීමට කටයුතු නොකර වැටුප් ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොටසක් ගෙවා ඇති අතර, ඉදිරියේ දි අනෙකුත් ගෙවීම් සිදු කිරීමට කටයුතු කරමි | ගෙවිය යුතු දායක මුදල් ගෙවා අවසන් කළ යුතුය |

2.3 ආදායම් පරිපාලනය

------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i.) | සමාලෝචිතවර්ෂයඅවසානයටඅයවියයුතුරු.239,82 2,872 කවරිපනම්බදුඅය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයකවරිපනම්හිඟය රු.1,000,000 ක් ඉක්ම වූ ඒකක 18 කින් ලැබිය යුතු රු.38,547,647 ක්, රු.100,000 සිටරු.1,000,000 අතරඒකක 584 කින්ලැබියයුතුරු.124,433,650 ක්හා රජයේදේපළඒකක 586 කින්අයවියයුතු රු.4,944,181 ක්ඇතුළත්ව පැවතුණි. | වරිපනම් අය කිරීමට අදාළ නීත්‍යානුකූල ගැටළු, දීර්ඝකාලීන ගැටළු හා වෙනත් හේතු නිසා හිඟ ශේෂ පවතින අතර, අය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇති බව | අය විය යුතු වරිපනම් බදු ආදායම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අය කර ගත යුතුය |
| (ii.) | සමාලෝචිත වර්ෂය තුළ දි ව්‍යාපාර ආයතනවලින් ව්‍යාපාර පදනම යටතේ වරිපනම් අය නොකර ගෘහස්ථ පදනම යටතේ අය කිරිම නිසා, දේපළ 60 ක් සඳහා ලැබිය යුතු රු.203,905 ක ආදායමක් අහිමි වී තිබුණි. | සමීක්ෂණයක් මඟින් දැනට සියලු දේපළ වෙනස්කම්වල තොරතුරු රැස් කර ඇති අතර, ඉදිරියේ දි තාවකාලික තක්සේරුවක් මඟින් අය කිරීම් සිදු කරමි | දේපළවල ස්වභාවය මත වරිපනම් ගණනය කර සභාවට අලාභ නොවන ආකාරයට වරිපනම් බදු අය කළ යුතුය |
| (ආ) | ජල බදු | | |
| (i.) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.207,558,454 ක ජල ගාස්තු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ එක් ඒකකයක හිඟය රු.1,000,000 කට වැඩි පාරිභෝගිකයින් 15 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.53,525,182 ක්, | ගිණුම් අනුව පවතින ශේෂය උපචිත පදනම මත පිළියෙල කරන අතර, මෘදුකාංගය අනුව පෙන්වන ශේෂය මුදල් | හිඟ ජල ගාස්තු අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | ඒකකයක හිඟය රු.500,000 සිට රු.1,000,000 අතර වූ පාරිභෝගිකයින් 16 දෙනෙකුගෙන් අය විය යුතු රු.10,056,429 ක් හා රු.100,000 සිට රු.500,000 අතරවූපාරිභෝගිකයින් 125 දෙනෙකුගෙන්අයවියයුතුරු.23,481,087 ක්ඇතුළත්ව තිබුණි. | පදනම මත ලැබෙන බැවින්, වෙනසක් පවතින අතර, ඉදිරියේ දි පරීක්ෂා කර නිවැරදි කරන බව | |
| (ii.) | ව්‍යාපාරික ස්ථාන සඳහා ජල සැපයුම් ගාස්තු ගෘහස්ථ නොවන පදනම මත අය නොකර ගෘහස්ථ පදනම මත අය කිරීම නිසා, ව්‍යාපාර ඒකක 26 කින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා ලැබිය යුතු රු.415,309 ක ජල ගාස්තු ආදායමක් අහිමි වී තිබුණි. | ජල කර්මාන්ත ඉංජිනේරුගේ ප්‍රධානත්වයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ඇති අතර, එම පරීක්ෂණ වාර්තාව අනුව, ව්‍යාපාරික ඒකක පදනමට ජල ගාස්තු සංශෝධනය කර ඇත | නිවැරදි පදනම් මත ජල ගාස්තු අය කළ යුතුය |
| (ඈ) | කුලී<br>-----<br>කඩ කුලී<br>---------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයත් දුම්රියපොළ පාර නව වෙළඳ සංකීර්ණයේ පවතින කඩ කාමර 262 ක් වෙනුවෙන් අය විය යුතු හිඟ කඩ කුළි රු.17,809,450 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ කඩ කාමර 34 කින් වසර 05 ක කාලයක් ඉක්මවා අය විය යුතු ශේෂය රු.554,898 ක් ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙස දැනුවත් කර කඩ හිමියන් වෙත අවසන් නිවේදන යවා ඇති අතර, ඉදිරියේ දි අය කිරීමට කටයුතු කරන බව | හිඟ කඩ කුලී ගාස්තු අය කළ යුතුය |
| (ඇ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| (i.) | මහා නගර සභාව සතු පොදු වැසිකිළි පද්ධති 08 ක් බදු දීම වෙනුවෙන් අය විය යුතු රු.7,168,543 ක් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයඅවසානය දක්වා අය කර නොතිබුණි. | කොටසක් ගෙවා ඇති අතර, ඉතිරි මුදල් මාසිකව ගෙවීමට බදුකරුවන් එකඟතාවය පළ කර ඇත | හිඟ මුදල් කඩිනමින් අය කළ යුතුය |
| (ii.) | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු රු.18,656,033 ක් වූ අතර, එම ශේෂය තුළ ත්‍රිරෝද රථ 921 කට අදාළව වසර 03 සිට වසර 05 අතර කාල පරාසයක් ඉක්මවා අය විය යුතු රු.18,182,827 ක් ඇතුළත්ව තිබුණි. | නඩු පැවරීම් සිදු කිරීම මඟින් කොටසක් අය කර ඇති අතර, ඉදිරියේ දි තොරතුරු සොයා ගත නොහැකි ත්‍රිරෝද රථ සඳහා ගාලපීම් සිදු කරන බව | හිඟ ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු අය කළ යුතුය |
| (ඉ) | දැන්වීම් පුවරු ආදායම්<br>------------------------ | | |
| | සමාලෝචිත වර්ෂයඅවසානයට ඩිජිටල් දැන්වීම් පුවරු 02 ක් සඳහා අය විය යුතු රු.4,096,291 ක් අය කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශයට යොමු කර ඇත | හිඟ ආදායම් අය කළ යුතුය |

(ඊ) රථ ගාල කුලියට දීමේ ආදායම්

---------------------------------

| | | |
|---|---|---|
| 2009 වර්ෂයේ සිට පැවත එන සභාවට අයත් මහනුවර රථ ගාල වෙනුවෙන් අය විය යුතු රු.200,567,833 ක කුළී සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අය කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, අදාළ පාර්ශව වෙත වරින් වර දැනුම්දීම් සිදු කර ඇති බව | හිඟ රථ ගාල් කුලි අය කර ගත යුතුය |

(උ)

| | | |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට සංචාරක තොරතුරු මධ්‍යස්ථානයෙන් අය විය යුතු රු.600,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට වසර 04 කට අධික කාලයක් ගත වී තිබුණ ද, අය කර නොතිබුණි. | මේ සම්බන්ධව පාර්ශවකරුවන් ගෙන්වා සාකච්ඡාවක් පැවැත් වූ අතර, ඉදිරියේ දී කොටස් වශයෙන් අය කර ගැනීමට එකඟතාවයකට පැමිණ ඇති බව | සභාවට ලැබිය යුතු ආදායම් අය කළ යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් කුඩා රත්වත්ත මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේ දී තෝරාගත් කොන්ත්‍රාත්කරු අදාළ ඉදිකිරීම් සිදු කරන අතරතුර විධිමත් අනුමැතියකින් තොරව සභාවට අයත් එක්සැවේටර් යන්ත්‍රයක්ඉදිකිරීම් කටයුතුවලට යෙදවීමේ දී අනතුරට පත් වී තිබුණි. පසුව මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට හා මෙම යන්ත්‍රයෙන් ඉටු කළ ගොහාගොඩ කසළ අංගනයේ කසළ හැසිරවීමේ කටයුතු සඳහා කුලියට ගත් යන්ත්‍රය වෙනුවෙන් රු.22,044,548 ක මහා නගර සභා අරමුදලින් ගෙවා තිබුණ ද, රක්ෂණය මඟින් හෝ පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල් අය කර නොතිබුණි. | ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා මත ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි. කර්මාන්ත කර ගෙන යාමේ දී කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් යන්ත්‍ර පැය ප්‍රමාණය අවසන් වී තිබූ නිසා, නැවත පැය ගණනක් දීර්ඝ කර ගැනීමට සභා අනුමැතිය ලැබෙන තෙක් මහා නගර සභාව සතු යන්ත්‍රය යෙද වූ අතර, අදාළ දිනයේ අධික වර්ෂාව නිසා මෙම අනතුරට මුහුණ දීමට සිදු විය | මෙවැනි කර්මාන්ත නිවැරදි අධීක්ෂණයක් හා නිසි සැලකිල්ලකින් යුතුව ක්‍රියාත්මක කළ යුතු අතර, අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනා ගත යුතුය |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව සතු අලුත්වැඩියා කර භාවිතා කළ හැකි රු.10,446,987 ක පස් කපන යන්ත්‍ර 02 ක් අලුත්වැඩියා නොකර හා අධික වර්ෂාව පවතින දිනවල ආපදාවට ලක් වන රු.2,950,000 ක අරුප්පල ශාඛා පුස්තකාලය ද අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග නොගෙන වසර 01 සිට වසර 08 දක්වා කාලයක් ද, වටිනාකම ගණනය කර නොමැති ලී බඩු හා පරිගණක උපකරණ විෂයයන් 10 ක් වසර 01 සිට වසර 03 දක්වා කාල පරාසයක් තුළ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | පස් කපන යන්ත්‍ර 02 වෙන්දේසි කර විකිණීමට පුවත්පත් දැන්වීම් පළ කර ඇතත්, මේ වන විට තක්සේරු ලබා ගැනීමේ ප්‍රමාදය නිසා සියලු කටයුතු ප්‍රමාද වී ඇත | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය |

3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කටුගස්තොට කලාප 04 කාර්යාල සංකීර්ණය ඉදිකිරීමට අදාළ ගෙවීම් බිල්පත් අනුව ඉටු නොකළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු රු.81,285 ක මුදල නැවත අය කර නොතිබුණි. | අවසන් බිල්පත්‍ර පිළියෙල කිරීමේ දී අඩු කර ගන්නා බව දන්වා ඇතත්, මේ වන විට ද අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් සිදු කළ යුතුය. වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (අ) | මහා නගර සභාවේ එකම අංශයක වසර 05 කට වඩා වැඩි කාලයක් සේවය කරන නිලධාරීන් 190 දෙනෙකු නිරීක්ෂණය වූ අතර, එම නිලධාරීන්ට අභ්‍යන්තර හෝ බාහිර ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | වසර 05 කට වැඩි නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා තීරණ ගැනීම වෙනුවෙන් කමිටුවක් පත් කර ඇති අතර, ඉදිරියේ දි එම කමිටු නිර්දේශ මත කටයුතු කරමි | අදාළ ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය |

| | | |
|---|---|---|
| (ආ) විශ්‍රාමික නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම<br>----------------------------------------------------<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, 2019 ඔක්තෝබර් 16 දිනැති අංක 03/2019 චක්‍රලේඛයට අනුකූල නොවන ලෙසට විශ්‍රාම ගිය නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ඉකුත් වර්ෂයේ නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා වූ කොන්ත්‍රාත් කාලය සඳහා රු.486,420 ක දීමනාවක් ගෙවා තිබුණි. | සභා සම්මුතිය මඟින් අනුමැතිය හිමි වී ඇති අතර, විධිමත් අනුමැතියක් ලැබෙන තෙක් විශේෂ ව්‍යාපෘතිය යටතේ සේවයේ යොදවා ගෙන දීමනා ගෙවා ඇත | විශ්‍රාමික සේවකයින් නැවත සේවයේ යෙදවීමේ දී අදාළ චක්‍රලේඛ හා නීති අනුව කටයුතු කළ යුතුය |